සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

2769

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංග කලාව |
| පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 03 යි |

නම / பெயர் / Name ..................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

## I කොටස

**උපදෙස්**

* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1) , (2) , (3) , (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

---

- පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක 01 සිට 04 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - අතට වළලු ද පයට ගිගිරි ද ලා ගනී
කිදුරඟන සොබනා
වනෙ සිඳුබුවො කඩා මල් පෙති
වරල සරසා ගනිති නිතිනා

B - ගම්බීර තෙදැති කොන්ස්තන්, තීනු පුරේ කොන්ස්තන්, තීනු පුරේ පුරවර්ධන කරන අග, නරනා මෙමං

C - ගෙයි පාන නෑ ගියෝතින් - මම අන්ධකාරෙ ඉන්නම්
මා බැන්ද පෙම්බරාගේ - ඒ වාසෙ මාගෙ වාසෙ
බෝ චණ්ඩ ව්‍යාඝ්‍ර ආදී - උන්නත් හිමාල දේසේ
එම් ස්වාමි එක්ක නික්මී - ඒ ජීවිතේට පේවී

D - සොක්කා එන්නේ දෙවනුව නැටුම් නටන්නේ
දැක්කා උන්ගේ සෙල්ලම් යසයි කියන්නේ
බක්කා ඉන්නේ නැටුමට මමයි කියන්නේ
සොක්කා දන්නේ නැටුමට බිම පෙරළන්නේ

E - හොරා හොරා කියමින් හඬ දෙන්නේ
ඒ ඇහිලයි මම එළියට පැන්නේ
දනිව් යකුනි තොපි මම කව්ද කියන්නේ
මේ වනයට මම පතිනිය වන්නේ

01. බන්දුල ජයවර්ධනගේ බෙර හඬ නාට්‍යයට අයත් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

02. නූර්ති නාට්‍ය සම්ප්‍රදායට අයත් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

03. උඩරට ගැමි නාටකයට අයත් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

04. නාඩගම් සම්ප්‍රදායට අයත් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය (4) D ය.

05. නාට්‍ය පෙළ රචනයේ දී
(1) සංවාද, රංග විධාන හා චරිත නිරවුල් විය යුතුයි.
(2) නළුවන්ගේ චලන රටා පිළිබඳව පිටපතෙහි සටහන් කල යුතුයි.
(3) ගැටුම් අවස්ථාව නාට්‍ය ආරම්භයේදීම නිරාකරණය කල යුතුයි.
(4) අතිශයෝක්තියෙන් යුතුව රචනා කල යුතුයි.

06. නළු නිළියන් විසින් වේදිකා අවකාශයෙහි චලන රටා ඇති කිරීම
(1) අංග රචනයයි. (2) රංග වින්‍යාසයයි. (3) නර්තන වින්‍යාසයයි. (4) නෘත්‍ය රචනයයි.

07. මහාචාර්ය ඇම්. එච්. ගුණතිලකයන් විසින් දේශිය කෝලම් නාට්‍ය ඇසුරෙන් නිර්මාණය කල වේදිකා නාට්‍ය,
(1) සක්කාය දිට්ඨි (2) රත්තරං (3) වෙල්ල වැහුං (4) නරිබෑණා

08. සංගීතය අවම වශයෙන් යොදා ගැනීම මෙන්ම සංගීතය යොදා නොගන්නා අවස්ථා ද දක්නට ලැබෙන්නේ,
(1) නාට්‍යධර්මී නාට්‍ය ශෛලියේදී ය. (2) ලෝකධර්මී ශෛලියේදී ය.
(3) එපික් රංග ශෛලියේදී ය. (4) අභූතරූපී ශෛලියේදී ය.

09. නාට්‍යයෙන් ඉදිරිපත් වන විවිධ අවස්ථාවන්ට උචිත අයුරින් රංග භූමිය සකස් කිරීම.
(1) වේෂ භූෂණය නම් වේ. (2) රංගාලෝකය නම් වේ.
(3) රංග භූමි අලංකරණය නම් වේ. (4) වෙස් මෝස්තර රචනය නම් වේ.

10. අභිරූපණ රංගයක් නිර්මාණය කිරීමේ දී යොදා ගනු ලබන ශිල්ප ක්‍රම වන්නේ,
(1) අනුකරණය හා සමාරෝප ශිල්ප ක්‍රම (2) අභ්‍යන්තර හා බාහිර ශිල්ප ක්‍රම
(3) පරිකල්පන හා අනුරූපණ ශිල්ප ක්‍රම (4) අනුකරණ හා ප්‍රතිනිර්මාණ ශිල්ප ක්‍රම

11. නාට්‍ය පිටපතෙහි ඇති කතාව ප්‍රේක්ෂකයාට ප්‍රදර්ශණය වන්නේ,
(1) චරිත මගිනි (2) අභිනය මගිනි (3) සංවාද මගිනි (4) නළුවන් මගිනි

12. නළුවරණය යනු
(1) නළු නිළියන් පුහුණු කිරීමයි. (2) නළු නිළියන් තෝරා ගැනීමයි.
(3) නළු නිළියන් රංගනයේ යෙදීමයි. (4) නළු නිළියන් රංග අභ්‍යාසයේ යෙදීමයි.

13. ආංගිකාභිනය මූලික කොට ගෙන වාචිකාභිනයෙන් තොරව යම් කිසි සිද්ධියක් හෝ ක්‍රියාකාරකමක් නිර්මාණශීලිව රඟ දක්වා පෙන්වීම
(1) ක්ෂණික නිරූපණය යි. (2) සමාරෝපය යි. (3) පරිකල්පනය යි. (4) අභිරූපණය යි.

14. වේෂ භූෂණය පිළිබඳව පහත ප්‍රකාශ අතුරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වේෂ භූෂණය මගින් චරිතයක් හඳුනා ගත හැක.
(2) චරිතයක වයස අනාවරණය කර ගත හැක.
(3) චරිතයක බුද්ධි මට්ටම හඳුනාගත හැක.
(4) චරිතයක මානසික ස්වභාවය ඉස්මතු කර දැක්විය හැක.

15. යම් චරිතයක් නිරූපණයේ දී රූපණ ශිල්පියා වැඩි අවධානයක් ලබා දිය යුත්තේ
(1) රංග අභ්‍යාස හා ක්‍රීඩා මැනවින් පුහුණු කිරීමටය.
(2) මනා කඩවසම් රූ සපුවක් නිර්මාණය කර ගැනීමටය.
(3) පරිකල්පන ශක්තිය වැඩි දියුණු කර ගැනීමට ය.
(4) පිටපත හොඳින් අධ්‍යයනය කර චරිතයේ භූමිකා හඳුනා ගැනීමටය.

16. රූපණ කාර්යයේදී රූපණ ශිල්පියා විසින් ප්‍රගුණ කල යුතු අංශ දෙක නම් කරන්න.
(1) බාහිර ප්‍රකාශනය හා වාචික ප්‍රකාශනය (2) අභ්‍යන්තර ප්‍රකාශනය හා බාහිර ප්‍රකාශනය
(3) වාචික ප්‍රකාශනය හා සාත්වික ප්‍රකාශනය (4) ආංගික ප්‍රකාශනය හා වාචික ප්‍රකාශනය

• පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 17 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | අනුවර්තනය/පරිවර්තනය | මෙරට පරිවර්තක/අනුවර්තක |
|---|---|---|---|
| යෙර්මා | A | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| B | ටෙනසි විලියම්ස් | අහස් මාලිගා | හෙන්රි ජයසේන |
| ද පබ්ලික් එනිමි | හෙන්ඩ්රික් ඉබ්සන් | ජන හතුරා | C |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | D | සුගතපාලද සිල්වා |

17. ඉහත වගුවේ A කොටසට ඇතුලත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
(1) ගාර්ෂියා ලෝකා (2) ඔස්කාර් වයිල්ඩ් (3) ෂෙරිඩන් (4) ජුලියස් හේ

18. ඉහත වගුවේ B කොටුවට ඇතුලත් විය යුතු නාට්‍යයේ නම කුමක්ද?
(1) ද ජස්ට් (2) ද හෝස් (3) මරාසාද් (4) ද ග්ලාස් මෙනාජරි

19. ඉහත වගුවේ C කොටුවට ඇතුලත් විය යුතු මෙරට අනුවර්තක/ පරිවර්තකගේ නම කුමක්ද?
(1) රංජිත් ධර්මකීර්ති (2) සුනන්ද මහේන්ද්‍ර (3) ඩග්ලස් සිරිවර්ධන (4) බන්දුල විතානගේ

20. ඉහත වගුවේ D කොටුවට ඇතුලත් විය යුතු අනුවර්තනය/ පරිවර්තනයේ නම කුමක්ද?
(1) කපුවා කපෝති (2) බෙර හඬ (3) හිත හොඳ අම්මණ්ඩි (4) මූදු පුත්තු

21. මනස මූලිකව හට ගන්නා භාවයන් ශාරීරික වශයෙන් ප්‍රකට කිරීම
(1) සාත්වික අභිනයයි (2) වාචික අභිනයයි (3) ආහාර්ය අභිනයයි (4) ආංගික අභිනයයි


22. පළමුවරට චිත්‍ර වස්ත්‍ර භාවිතය මගින් වේදිකාව තුල පසුතල මැවූ නාට්‍ය වර්ගය කුමක්ද?
(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) නූර්ති

23. "වෙස් අත්ත" රංග භූමියේ කොටසක් ලෙස භාවිතා කරනු ලබන ගැමි නාටකය කුමක්ද?
(1) සොකරි (2) කෝලම් (3) ටීටර් (4) පාස්කු

24. දෘශ්‍ය කලා දැක්වෙන වරණය තෝරන්න
(1) චිත්‍ර, මූර්ති, කැටයම් (2) චිත්‍ර, බැලේ, නාට්‍ය (3) මූර්ති, ගීත, නාට්‍ය (4) ඔපෙරා, කාටූන්, කැටයම්

25. මතු පිටින් පෙනෙන අර්ථයට වඩා ව්‍යංගයෙන් ඇඟවෙන යටි පෙළක් සහිතව ප්‍රේක්ෂකයාට රසයක් සහ ජීවිතාවබෝධයක් ලබා දෙන්නේ,
(1) ගීත නාට්‍ය මගිනි. (2) බැලේ මගිනි. (3) ඔපෙරා මගිනි. (4) වේදිකා නාට්‍ය මගිනි.

• පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක 26 සිට 29 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A B C D E

26. සෝමරත්න දිසානායක නාට්‍යවේදියාගේ මීපුර වැසියෝ වේදිකා නාට්‍යයේ ගත්කතුවරයාගේ චරිතය රඟපෑ ප්‍රවීණ චිත්‍රපට, ටෙලි නාට්‍ය, හා වේදිකා නාට්‍ය ශිල්පියා වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

27. ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියා ලෙස සැලකෙන ශිල්පියා/ශිල්පිණිය වන්නේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

28. ළමා නාට්‍ය නිර්මාණකරණයේ යෙදුනු රංග ශිල්පියා/ශිල්පිණිය වන්නේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

29. හාස්‍ය නිරූපණය සඳහා ප්‍රකට නාට්‍ය, සිනමා හා ටෙලි නාට්‍ය යන මාධ්‍ය තුනෙහිම කැපී පෙනෙන රංගන ශිල්පියා වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

30. ''දෙයක් වේ නම් යම් සුදුස්සාටම අයිති විය යුතු'' යන්න තේමාව කර ගත් හෙන්රි ජයසේනයන් විසින් පරිවර්තනය කරන ලද නාට්‍යය
(1) හුණුවටයේ කතාව නාට්‍යය යි. (2) දිරිය මව සහ ඇගේ දරුවෝ නාට්‍යය යි.
(3) මකරා නාට්‍යය යි. (4) අහස් මාලිගා නාට්‍යය යි.

31. නූර්ති සම්ප්‍රදායේ ජනප්‍රියම නූර්ති රචකයා නම් කරන්න.
(1) චාල්ස් ඩයස් (2) ජෝන් ද සිල්වා (3) දොන් බස්තියන් (4) ක්‍රිස්තියන් පෙරේරා

32. නූතන සිංහල නාට්‍ය කලාවේ මුල්ම අවස්ථාව වන්නේ,
(1) නාඩගම් නාට්‍ය කලාවයි. (2) ටීටර් නාට්‍ය කලාවයි.
(3) මිනර්වා නාට්‍ය කලාවයි. (4) ආදී විශ්ව විද්‍යාල නාට්‍ය කලාවයි.

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ඇසුරින් 33 හා 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B

33. ඉහත A හා B වෙස් මුහුණු පිළිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) A සන්නි මුහුණක් වන අතර B කෝලම් මුහුණකි. (2) A කෝලම් මුහුණක් වන අතර B සන්නි මුහුණකි.
(3) A සහ B දෙකම කෝලම් මුහුණු දෙකකි. (4) A සහ B දෙකම සන්නි මුහුණු දෙකකි.

34. A වෙස් මුහුණ සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ
(1) පූර්ව රංගයට අයත් වෙස් මුහුණකි. (2) අපර රංගයට අයත් වෙස් මුහුණකි.
(3) සත්ව ගණයට අයත් වෙස් මුහුණකි. (4) සූනියම් යක්ෂණියට අයත් වෙස් මුහුණකි.

35. පහත නාට්‍ය වරණ අතුරින් විශ්ව විද්‍යාල සිංහල සමිතිය මගින් රඟ දැක්වූ නාට්‍ය ඇතුලත් වරණය තෝරන්න.
(1) බෝඩිංකාරයෝ, ජනේලය, බහින කලාව (2) මනමේ, රත්තරං, වලහා,
(3) ඉබේ වෙදා, කපුවා කපෝති, පුදුම බේරිල්ල (4) වඳින්න ගිය දේවාලේ, ඒකට මට හිනා හිනා, දුන්න දූනු ගමුවේ

36. පත්තිනි පූජාව මුල් කොට ගත් විනෝදාස්වාදය හා සශ්‍රිකත්වය ලබා ගැනීම උදෙසා පවත්වනු ලැබූ උඩරට ජන නාටකය කුමක් ද?
(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) ටීටර්

37. පුනාවට වස් දොස් එකතු කොට, ගවයෙකු ගේ හිසේ ගසා පුනාව බිඳ දමමින් සිදු කරනු ලබන ශාන්තිකර්මය අයත් වන්නේ කුමන රංග සම්ප්‍රදායට ද?
(1) උඩරට (2) පහතරට (3) සබරගමු (4) කුත්තු

38. වර්තමාන ප්‍රොසීනියම් වේදිකාව භූගෝලීය වශයෙන් බෙදා ඇති කොටස් ගණන කීයද?
(1) 6 (2) 9 (3) 12 (4) 3

39. මිනිස් සිතේ ඇතිවන ගැඹුරු හා අපූරු ස්වභාවයන් එළි පෙහෙළි කිරීම අරමුණු කොටගත් නාට්‍ය විශේෂයකි.
(1) කෝලම් (2) ටීටර් (3) මිනර්වා (4) කෙටි නාට්‍ය

40. මුල් කෘතියේ එන චරිත හා ස්ථාන නාම වෙනස් කරමින් මූලික සිද්ධිය උකහාගෙන පරිසරයට ගැලපෙන ආකාරයෙන් සකස් කරනු ලබන නාට්‍ය කෘතිය
(1) සමකාලීන නාට්‍යයකි . (2) අනුවර්තනයකි. (3) ස්වතන්ත්‍රයකි. (4) පරිවර්තනයකි.

2767

## II කොටස

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මෙම නාට්‍ය තුල සාකච්ඡා වන්නේ කුමන වයස් කාණ්ඩයක ප්‍රශ්න පිළිබඳව ද? (ල. 2)

ii. මෙම නාට්‍යය තුල ඛේදනීය තත්වයට පත්වන චරිත 02 ක් නම් කරන්න. (ල. 2)

iii. නාට්‍යාරම්භයේ දී අවසර ගැනීමේ යැදුමට මූලික කර ගන්නේ කවර බෙර වාදනයක් ද? (ල. 2)

iv. විකෘති නාට්‍යයේ එන 'විහාගේ විහාගේ' ගීතය රංගනයේ දී වේදිකාවේ භාවිතා කරන රංගාලෝක පහන කුමක් ද? (ල. 2)

v. අධ්‍යක්ෂවරිය විසින් නාට්‍ය රංගනය ගොඩ නැගීමට භාවිතා කර ඇත්තේ කුමන නාට්‍යකරුවාගේ රංග ශෛලියද? (ල. 2)

vi. යෞවනත්වය නොසලකා හරිමින් වැඩිහිටියන් විසින් දරුවන්හට සිදු කරනු ලැබූ බලහත්කාරකම් 02 ක් මෙම නාට්‍ය ඇසුරින් ලියා දක්වන්න (ල. 2)

(ලකුණු 2 x 6 = 12)

02. i. ප්‍රාසංගික කලාව යනු කුමක් ද? (ල. 3)

ii. නාට්‍ය කලාව හැර ඔබ දන්නා වෙනත් ප්‍රාසංගික කලාවන් 03 ක් නම් කරන්න. (ල. 3)

iii. ඉහත 2 හි ඔබ දැක්වූ ප්‍රාසංගික කලාවන්ගෙන් නාට්‍ය කලාව වෙනස් වන ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න. (ල. 6)

03. i. අතීතයේ ශාන්තිකර්ම සහ ගැමි නාටක සඳහා ආලෝකය ලබා ගැනීමට භාවිතා කල පහන් වර්ග 2 ක් දක්වන්න. (ල. 2)

ii. වර්තමාන ප්‍රොසීනියම් වේදිකාව සඳහා රංගාලෝකය සැපයීමට භාවිතා කරන පහන් වර්ග 2 ක් හා උපකරණ 2 ක් ලියන්න. (ල. 4)

iii. රංගාලෝකය භාවිතයෙන් නාට්‍යයකට ඇති ප්‍රයෝජන ඔබ නැරඹූ නාට්‍ය ඇසුරින් නිදසුන් දෙමින් විමසන්න. (ල. 6)

04. i. රටයකුම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු 02 ක් ලියන්න. (ල. 3)

ii. රටයකුම ශාන්තිකර්මයේ එන අන්තර් රංග අවස්ථා නම් කරන්න. (ල. 3)

iii. ඉහත ඔබ දැක්වූ එක් අන්තර් රංග අවස්ථාවක දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න. (ල. 6)

05. i. නාඩගම් පූර්ව රංගනයේ එන චරිත 02 ක් ලියන්න. (ල. 2)

ii. නාඩගම් ප්‍රභවය පිළිබඳව මතවාද 02 ක් ලියා දක්වන්න. (ල. 4)

iii. නූර්තියේ පැමිණීමත් සමග නාඩගම අභාවයට යෑමට හේතු වූ කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න. (ල. 6)

06. i. දේශීය නාට්‍ය කලාව සහ සිංහල සාම්ප්‍රදායික ගැමි කලාව පිළිබඳව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත පර්යේෂණ ග්‍රන්ථය නම් කරන්න. (ල. 2)

ii. ජාතක කතා ඇසුරින් සරච්චන්ද්‍රයන් විසින් රචනා කල නාට්‍ය 02 ක් සහ ඒවාට පාදක වූ ජාතක කතා 02ක් ලියා දක්වන්න. (ල. 4)

iii. සිංහල නාට්‍ය කලාවේ වර්ධනය සඳහා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් දැක් වූ දායකත්වය පිළිබඳව ඇගයීමට ලක් කරන්න. (ල. 6)

07. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව, හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකිය.

කමල්, විමල් සහ නිමල් මිතුරන් වන අතර පාසල් නිවාඩුවට නිමල්ගේ ගම වන මාතර යෑමට සූදානම් වෙති. මෙහිදී දෙමව්පිය අවසරයද ලබා ගන්නා ඔවුන් දුම්රියෙන් මාතර යෑමට දුම්රිය ස්ථානයට යති. දුම්රිය වේදිකාවේ දී ඔවුන් වෙත පැමිණෙන පුද්ගලයකු තමා අසල කඩයෙන් කෑමට යමක් ගෙන එනතුරු තම පෙට්ටිය බලා ගන්නා ලෙස පවසා ඉවත්ව යයි.

i. පසුබිම කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ල. 4)

ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ල. 4)

iii. කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ල. 4)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න